# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2367/24 - 2024 ජනවාරි මස 19 වැනි සිකුරාදා - 2024.01.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය : ජීසීඑෆ්/අත්/ඩීඑල්/40/එල්ආර්.*
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය: එල්ඩී/05/2005/එල්ආර්බී/263.*

මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අත්තිඩිය වැව පාරේ කාණු පද්ධතිය සංවර්ධනය සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*රජයට පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අත්තිඩිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2013.07.04 දිනැතිව පිළියෙල කර ඇති අංක. 9366 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර්. 0.0147 ක් වන පහත විස්තර කර ඇති ඉඩම් කැබැල්ල :

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: අත්තිඩිය වෙල්යාය; වර්තමාන ඉඩම් පරිහරණය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0147.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2024.03.13 දින පෙ.ව. 10.00 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක. 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ නිළධාරි කාර්යාලයේ දී මා හමුවිය යුතුය.

තවද, 2024.03.06 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම අත්කර ගැනීම සඳහා වන්දි මුදල ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එච්. තිලකවර්ධන,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය,
දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2024 ජනවාරි මස 16 වැනි දින,
මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය
අත්කර ගැනීමේ නිළධාරි කාර්යාලය,
අංක. 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය

EOG 01-0180


1A : PG 6626 – 06 (01/2024) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*